# ප්‍රජාතාන්ත්‍රික අරගලයන් සඳහා ස්ත්‍රීන්
## ஜனநாயக போராட்டங்களுக்கான பெண்கள்
# Women for Democratic Struggles

මාධ්‍ය හමුව
අගෝස්තු, 2, 2022

1. අපි ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, යුක්තිය සහ සමානාත්මතාවය වෙනුවෙන් කැප වූ වාගරීක, ආගමික සහ භූගෝලීය වෙනස්කම් නොතකා එක්වූ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් පිරිසක් වෙමු. එමෙන්ම, අප විසින් 2 වැනි දකුණේ කැරැල්ලේදී, සිවිල් යුද්ධයේදී සහ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකා රාජ්‍යයේ මදර්නකාරී ක්‍රියාදාමයන්ට දිගින් දිගටම අභියෝග කළෙමු.

2.වත්මන් රජය විසින් හදිසි නීතිය ප්‍රකාශ කිරීම සහ විරෝධතාකරුවන්, "මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්, ෆැසිස්ට්වාදීන්, ත්‍රස්තවාදීන්, අන්තවාදීන්" යනාදී ලෙස නිරූපණය කරමින් ඔවුන් මදර්නය කිරීම අපි තරයේ හෙළා දකිමු. විරෝධතාකරුවන් දඩයම් කිරීම සහ බොරු චෝදනා මත අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම නතර කරන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිමු

3. මෙම මදර්න උපක්‍රම අලුත් නොවන බවත්,විශේෂයෙන්ම මෙම උපක්‍රම උතුරු සහ නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදී සහ සාමකාමී විරෝධතා මැඩලීමේ දීඝර් ඉතිහාසයක් ශ්‍රී ලංකා රාජ්‍යයට ඇත. උතුරු නැගෙනහිර දෙමළ ජනතාව රාජ්‍යයේ මදර්න යන්ත්‍රය දිගු කලක් අත්විඳීමට සිදුවී ඇති අතර,
එය දිගටම කරගෙන යමින් සිටිති. නිදසුනක් වශයෙන්, අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයන් සත්‍යය සහ යුක්තිය සඳහා ඔවුන් විසින් කරන ලද අරගලය හේතුවෙන් අඛණ්ඩව හිරිහැරවලට සහ නිරීක්ෂණයට ලක් වේ.

4.පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව, රජය ද අහිංසක මුස්ලිම් ජනතාව සිය ගණනක් අන්තවාදීන් ලෙස මවා දක්වමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගන්නා ලදී.

5."අරගලය" විරෝධතාවලට ශ්‍රී ලාංකීය සමාජයේ සැමගේම සහය විවිධ මට්ටම් වලින් ලැබී ඇත. මෙම විරෝධතා සඳහා කාන්තාවන් ඉතා උනන්දුවෙන් සහභාගී වූ අතර, තවදුරටත් ජනතාවගේ විශ්වාසය හෝ විශ්වාසය භුක්ති නොවිඳින රජය විසින් පනවා ඇති ආර්ථික දුෂ්කරතාවලට එරෙහිව විරෝධතා දැක්වීමට පෙළ ගැසුණු පුරවැසියන්ගේ ව්‍යාපාරයකි.

6.සාමකාමීව රැස්වීමට, විරෝධතා දැක්වීමට සහ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයට ඉතා වැදගත් වේ. මෙම මූලික අයිතිවාසිකම් මදර්නයට අභියෝග කිරීම සඳහා ආචාර ධමර් හා ආගමික වෙනස්කම් නොතකා, සහයෝගයෙන් කටයුතු කිරීමට අපි කැපවී සිටිමු.

7.නීතියේ ආධිපත්‍යය සහ නීතිය ඉදිරියේ සමානාත්මතාවය ආරක්ෂා කරන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම, 2022 මැයි 9 වන දින සාමකාමී විරෝධතාකරුවන්ට සහ ඔවුන්ගේ කූඩාරම්වලට පහර දීම සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට ගණන් දෙන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිමු. එම අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් වීඩියෝ සාක්ෂි තිබේ.

8. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ඇතුළු ක්‍රමානුකූල/ව්‍යුහාත්මක වෙනස්කම් සහ මහජන සභාවක් කි්‍රයාත්මක කිරීම හරහා ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීම සඳහා කාන්තාවන් සහ තරුණයින් ඇතුළු ජනතාව වැඩි වශයෙන් සම්බන්ධ කර ගැනීම සඳහා "අරගලය" විසින් කරන ලද ඉල්ලීමට අවනත වන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිමු.

56/1, Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka.
WomenforDS@protonmail.com>